දැන්වීමයි

Pay-It-Forward ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා අයදුම්පත් කැඳවීම - 2026

ව්‍යවහාරික විද්‍යා පීඨයේ සහ නාගරික හා ජලජ පෛව සම්පත් පීඨයේ ඉගෙනුම ලබන අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජීය හෝ පාරිසරික ක්ෂේත්‍රයක් ආශ්‍රිතව ප්‍රජා මූලික ව්‍යාපෘතියක් හා සම්බන්ධව කටයුතු කරනු ලබන උපාධි අපේක්ෂකයින් උදෙසා පිරිනමනු ලබන **Pay-It-Forward** විශේෂ ශිෂ්‍යත්වය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

1. ශිෂ්‍යත්වයේ ස්වභාවය සහ වටිනාකම

වාර්ෂිකව එක් සිසුවෙකු සඳහා පිරිනමනු ලබන මෙම ශිෂ්‍යත්වයේ මුළු වටිනාකම රුපියල් 100,000/- කි.

මීට අමතරව, තේරී පත්වන සිසුවාට සිය ව්‍යාපෘති ප්‍රගතිය හා වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් ශිෂ්‍යත්ව දායකයාගෙන් සෘජු මාර්ගෝපදේශනය (Mentorship) ගිම්වේ.

2. අයදුම් කිරීමේ සුදුසුකම්

ව්‍යවහාරික විද්‍යා පීඨයේ හෝ නාගරික හා ජලජ පෛව සම්පත් පීඨයේ දැනට සාර්ථකව අධ්‍යයන කටයුතුවල නිරත 2 වන හෝ 3 වන වසරේ උපාධි අපේක්ෂකයෙකු විම.

ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතියක් සංවිධානය කර සාර්ථකව ක්‍රියාත්මක කිරීමට දායකවී සිටීම.

3. අයදුම් කිරීමේ ක්‍රියාපටිපාටිය

සුදුසුකම් ලත් සිසුන් පහත සඳහන් ලේඛන සහිතව අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය:

- සම්පූර්ණ කරන ලද අයදුම්පත.
- සිය ව්‍යාපෘතිය පිළිබඳ වචන 500 කට නොවැඩි සවිස්තරාත්මක විස්තරය (Essay): (පහත කරුණු අනිවාර්යයෙන් අන්තර්ගත විය යුතුය):

1) අදාළ ප්‍රජා සේවා ව්‍යාපෘතියේ විස්තරය (අධ්‍යාපන, සෞඛ්‍ය, සමාජීය හෝ පාරිසරික ක්ෂේත්‍රයක් ආශ්‍රිතව).
2) එම ව්‍යාපෘතිය ප්‍රජාවට වැදගත් වන ආකාරය සහ එහි ඇති අවශ්‍යතාව.
3) ව්‍යාපෘතිය මගින් අපේක්ෂිත සාධනීය බලපෑම (Expected Impact).
4) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රායෝගික සැලසුම (Implementation Plan).

4. තේරීමේ ක්‍රියාවලිය

අයදුම්පත් පරීක්ෂා කිරීමෙන් අනතුරුව, කෙටි ලැයිස්තුගත කරණු ලබන අපේක්ෂකයින් ශිෂ්‍යත්ව දායකයා සහ විශ්වවිද්‍යාලයීය අධ්‍යයන කාර්ය මණ්ඩල සාමාජිකයන්ගෙන් සමන්විත විනිශ්චය මණ්ඩලයක් ඉදිරියේ පැවැත්වෙන වාචික සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

CamScanner

තේරී පත් වූ අයදුම්කරු එකහ වන විශේෂිත ප්‍රජා සේවා ව්‍යාපෘතිය මත පදනම්ව නිරීක්ෂණ නිර්ණායක තීරණය කරනු ලබන අතර තේරී පත්වූ අයදුම්කරු ප්‍රජා සේවා ව්‍යාපෘතියට සහභාගී වූ පැය/දින ගණන වාර්තා කිරීම සඳහා මාර්ගගත වාර්තාකරණ පද්ධතියක් (online tracking system) හඳුන්වා දෙනු ඇත.

5. අයදුම්පත් භාරගන්නා අවසන් දිනය: 11/12/2026

6. අයදුම්පත් යොමු කළ යුතු ආකාරය:

අයදුම්පත් ශිෂ්‍ය සුබසාධක අංශය වෙතින් ලබාගතහැකි අතර නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් සහ ව්‍යාපෘති විස්තරය, අදාළ සහතික පිටපත්ද සමඟ ඉහත සඳහන් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට හෝ එදිනට පෙර ශිෂ්‍ය සුබසාධක අංශය වෙත යොමු කරන්න.

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුබසාධක අංශය
11/11/2026

නියෝජ්‍ය ලේඛකාධිකාරී
ශිෂ්‍ය සුභසාධක අංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල - නුගේගොඩ.